# ECHO OF HIS CALL

ECHO OF HIS CALL REACHING NATIONS SINCE 1969
1969 TO 2029

# කැඳවීමේ ප්‍රතිරාවය

SINHALA

India's National Spiritual Newspaper

₹ 10/-

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

Editor : S. SAM SELVA RAJ

16 Languages

Vol. XIX YEAR OF OUR LORD JESUS CHRIST, 2025 OCTOBER Issue No. 11


## ශුද්ධවූ බයිබලය

### (ගීතාවලිය 29:1-9)

01. බලවතුන්ගේ පුතුයෙනි, ස්වාමීන්ට දෙව්, මහිමයත් බලයත් ස්වාමීන්ට දෙව්.

02. ස්වාමීන්ගේ නාමයට පියයුතු මහිමය දෙව්, ශුද්ධකමේ අලංකාරයෙන් ස්වාමීන්ට නමස්කාරකරව්.

03. ස්වාමීන්ගේ ශබ්දය ජල මතුයෙහිය මහිමයෙන් යුක්තවූ, දෙවියන්වහන්සේ, එනම් ජල රාශි මතුයෙහි වැඩසිටින ස්වාමීන්වහන්සේ ගර්ජනා කරනසේක..

04. ස්වාමීන්ගේ ශබ්දය බලවත්ය, ස්වාමීන්ගේ ශබ්දය මහිමයෙන් පූර්ණය.

05. ස්වාමීන්ගේ ශබ්දය කිහිරිගස් බිඳියි, එසේය, ස්වාමීන්වහන්සේ ලෙබනොන්හි කිහිරිගස් කැබෙලිකොට බිඳිනසේක.

06. උන්වහන්සේ ඒවා වස්සෙකු මෙන්ද ලෙබනොන් සහ සිරියොන් කඳු තරුණ වල් ගොනෙකු මෙන්ද පෙම්කෙළින්ට සලස්වනසේක.

07. ස්වාමීන්ගේ ශබ්දය ගිනිදැල් බෙදයි.

08. ස්වාමීන්ගේ ශබ්දය වනාන්තරය සොලවයි; ස්වාමීන්වහන්සේ කාදෙෂ් වනාන්තරය සොලවනසේක.

09. ස්වාමීන්ගේ ශබ්දය මුවදෙනුන් ප්‍රසවයකරවයි, වනය පාළුකරයි. උන්වහන්සේගේ මාලිගාවෙහි සියල්ලා: මහිමය ඒවා කියයි.

# ඔබගේ ආශිර්වාදමත් අනාගතයකට රහස් හතකි!



SEVEN SECRETS of your blessed future!!

**Sis. Angel**



*ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් ඔබ සියලු දෙනාටම සුභ පතමි!*

සෑම මසකම *කැඳවීමේ ප්‍රතිරාවය* සඟරාව තුළින් ඔබ හා සම්බන්ධ වීම ගැන මා ඉතා සතුටුවෙමි. ඔබ සියලු දෙනාම ස්වාමීන් වහන්සේ තුළ සතුටින් සිටිනවාය කියා මා විශ්වාස කරමි. අපගෙන් සමහරු මේ මොහොත වන විට ජීවිතයේ කිසියම් අපහසුතාවයක සිටිනවා වන්නට හැකිය. මෙම සඟරාව ඇදහිල්ලෙන් පියවරෙන් පියවර කියවන්න. මන්ද දෙවියන් වහන්සේගේ සැලැස්ම ඔබගේ ජීවිතයෙහි තවම නිමාවී නොමැත. උන්වහන්සේ තවමත් ඔබගේ ජීවිතය ගැන සැලකිමෙන් පාලනය කරමින් සිටී.

පසුගිය දිනවලදී මගේ හදවතට ''ඔබව ආරක්ෂා කරගන්න'' යන මාතෘකා හරහා මගේ හදවත තුළ බොහෝ සිතුවිලි පැන නැගුණේය. ඒ ගැන මා අධ්‍යයනයක යෙදුනෙමි . එහිදී මා හැදෑරූ කරුණු ඔබ හා සමග බෙදා ගැනීමට කැමැත්තෙමි.

දේව වචනය ''අපව ආරක්ෂා කරගන්න '' කියා පවසන්නේ අප අවට සිදුවන දේවල් ගැන අප ඉතා අවධානයෙන් සිටිමින් අපව ආරක්ෂා කරගන්නා ලෙසයි. අපවව ආරක්ෂා කර ගත යුතු සමහර කරුණු ඔබ හා සමග මා බෙදා ගැනීමට කැමැත්තෙමි .

3 වෙන පිටුව ...




**Echo of His Call**

*Christian YouTube Channel!*

**An opportunity to pray with Pr. S. Sam Selva Raj!**

Message & Prayer in 5 minutes!!

**English, Hindi, Tamil & Telugu**

Every day – From 2.00 A.M.

**Tamil Sunday Service – 8.30 A.M.**

★ Please Subscribe and Share ★

ECHO OF HIS CALL TEACHING NATIONS SINCE 1969 1969 TO 2029

# ECHO OF HIS CALL - (Marching towards 60th year)

## from your dearly beloved brother...





"…..මාගේ මුහුණේ සැපදායක වූ මාගේ දේව වූ ස්වාමින් වහන්සේට තවම ස්තුති ප්‍රශංසා කරන්නෙමි." (ගීතාවලි 42:11)

**ස්වාමින්වහන්සේ තුළ ප්‍රිය මිත්‍රවරුනි,**

බොහෝ අවස්ථාවන්වලදී දෙවියන්වහන්සේ අපව ඉතා අමාරු තත්ත්වයන් තුළ ගෙනයන බව සත්‍යයකි. මේ දේ උන්වහන්සේ කරනු ලබන්නේ අපව තවත් ශක්තිමත් කිරීමටත් උන්වහන්සේ වෙතට ළංකිරීමටත්ය. ගීතාවලිය 42 වන පරිච්ඡේදයෙහි දාවිත් මෙවැනි තත්ත්වයක් තුළින් ගමන් කළ බව අපට පෙනෙයි. මෙහිදී ඔහු පවසන්නේ තන්දේ පිට මිරියාවකට, කාන්තාරයේ පිට ගංගාවන් අතරට, ඉතාම අමාරු හදවතකින් යහ සාමය සඳහා පොර බදින ආත්මයකින් බලා සිටීම ගැනත් ඔහු පවසයි. නමුත් ඒ සෑම දේ මධ්‍යයේ ඔහු දෙවියන්වහන්සේට ප්‍රශංසා කළ බව පවසයි.

උන්වහන්සේ තුළ ඉතා ගැඹුරු ඇදහිල්ලක් ඇතිව අප ජීවිත්තට අවශ්‍ය නම්, අපට වේදනා එන කල්හි අප දෙවියන් වහන්සේට ප්‍රශංසා කළ යුතුයි. අපගේ අමාරු අවස්ථාවන්වලදී දෙවියන්වහන්සේට ප්‍රශංසා කළ යුතුයි. අප වටා අඳුරු වලාවන් පැමිණෙන මොහොතේදී පවා අප ස්වාමින් වහන්සේගේ සත්‍යතාවය තුළ රැඳා පැවතිය යුතුයි. මගේ පුද්ගලික අත්දැකීම නම් මෙයයි. අපගේ මුල් නම්; අපගේ බලාපොරොත්තුවයි. එලදැරීම යනු ප්‍රශංසා කිරීමයි. ප්‍රශංසව හා නමස්කාරය ස්වාමින් වහන්සේ තුළ අපට තිබෙන ඇදහිල්ලේ මුල් සව තවත් ශක්තිමත් කරයි. එබැවින් ඔබ අධෛර්යයට පත්ව සිටින්නේ නම් ඔබගේ බලාපොරොත්තුව අත් නොහරින්න. *ඔබගේ බලාපොරොත්තුව ස්වාමින්වහන්සේ තුළ තබාගන්න.* "දෙවියන් වහන්සේ කෙරෙහි බලාපොරොත්තු තබාගන්නේ කෙසේද?"කියා ඔබ ඇසීමට පුළුවනි. එයට මගේ පිළිතුර නම්; දාවිත් දෙස බලන්න, දාවිත් කළ දෙය ඔබත් කරන්න." යනුවෙනි.

"ස්වාමින් වහන්සේට ප්‍රශංසා කරමි." මා රෝගී තත්ත්වයෙන් පසු වන විටදීත් මා උන්වහන්සේට ප්‍රශංසා කරමි. ගුණවන්ත ගීතින් උන්වහන්සේට ප්‍රශංසා කරමි. ඔබ නොයෙකුත් අමාරුකම් හා ආර්ථික ප්‍රශ්න තුළින් ගමන් කරනු ලැබුවත්, ස්වාමින් වහන්සේ ඔබට ලැජ්ජාවට පත් නොකරයි. අපගේ සෑම දේම යහපත්ව තිබෙන විටදී උන්වහන්සේට ප්‍රශංසා කිරීමට හා ගුණවන්තව ප්‍රශංසා කිරීම ඉතාම පහසුයි. නමුත් අපට සෑම දේම වරදින විටදීත් අපගේ අමාරු කාලයන් වලදීත් ගුණවන්ත ගීතින් උන්වහන්සේට ප්‍රශංසා කිරීම උන්වහන්සේ ඉතාම ප්‍රිය කරයි.

මෙය දාවිත් ගේ ජීවිතයෙහි සත්‍යයක් විය. දෙවියන්වහන්සේ ඔහුගේ සතුරන්ව පරාජයට පත් කළේය. ඔහුට අහිමි වූ සෑම දේම උන්වහන්සේ ඔහුට ලබා දුන්සේක. යෝබ්ටද සියලු දේ නැති වුවත් අවසානයේදී දෙවියන් වහන්සේ ඔහුට දෙගුණයක් ආශීර්වාද කළේය. දේව වචනය මෙසේ පවසයි. "…..*ස්වාමින්වහන්සේ ද යෝබ් පිළිගත් සේක.*" *(යෝබ් 42:9)* ස්වාමින්වහන්සේ යෝබ්ව පිළිගත් සේක. තවත් ආකාරයකින් පවසනවා නම්; *දෙවියන් වහන්සේ යෝබ්ගේ මුහුණ දෙස බැලූ සේක,* යනුවෙනි. මෙය කොපමණ අලංකාර අත්දැකීමක්ද! ඒ ආකාරයට දෙවියන් වහන්සේ ඔබටත් කරනවා ඇත. ඔබගේ බලාපොරොත්තුව ස්වාමින්වහන්සේ දෙස තබන්න. ස්වාමින් වහන්සේ ඔබටත් යහපත් දේ කරයි.

ස්වාමින් වහන්සේ අපගේ සේවාවන්වලට බහුල ලෙස ආශීර්වාද කර තිබේ. ඇත්තෙන්ම, "*ස්වාමින්වහන්සේ මාගේ එඬේරාය; මට හිඟයක් නොවන්නේය.*" *(ගීතාවලිය 23:1)* මේ ආකාරයට දෙවියන් වහන්සේ අපගේ සේවාවන්වලට බලවත් ලෙස ආශීර්වාද කරන සේක. මේ මාසයේදී දෙවියන්වහන්සේ ඔබට නව ආලේපයක් දෙමින් උන්වහන්සේගේ කරුණාව වගුරුවමින් ඔබව කිරීමට යන්නාවූ ආශීර්වාද තුළින්; "මට කිසි හිඟයක් නොවන්නේය." කියා ඔබට පැවසීමට හැකිය කියා මා විශ්වාස කරමි.

අපගේ *සැඳවීමේ ප්‍රතිරාවය* සේවය නිසා ඔබ දිනටම යාච්ඤා කරන්න. ස්වාමින් වහන්සේ ඔබව පසයා දෙන ප්‍රමාණයට හැකි අයුරින් එම සේවය සඳහා ඔබගේ සහයෝගය සහ උපකාරය ලබා දෙන්නය කියා ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිමි.

ස්වාමින්වහන්සේ ඔබට බහුල ලෙස ආශීර්වාද කරන සේක්වා !

*In Christ Jesus, your servant,*

***Pr. S. Sam Selva Raj,*** E.mail : sam@echoofhiscall.org



**OUR MISSION POLICY**

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.


**HON. EDITOR-IN-CHIEF**

Rev. Dr. Angeline S. Kumari, M.A., M.Sc., M.Ed.

**EX MANAGING EDITOR**

Pastor Alex Samson Sam, B.Th., M.Div.

**GENERAL MANAGER**

Bro. N. Prakasam, M.A., M.Sc.(C&P), PGDHRM, MBA.

**ADMINISTRATION**

Sis. Jesy Veena Sam
Adv. K. Puratchivendan, M.Com., C.A., B.L.
Dr. P.E.R. Premchand, M.Sc., M.A., M.Ed., Ph.D.
Dr. C.G.S. Baburao, B.Tech, M.Tech. (DM), Ph.D.
Dr. Rabinder Boaz, M.S. (CMC)

**EDITORIAL BOARD**

Dr. Serena Bevin, M.A., M.Phil., B.Ed.
Sis. Sajini Cherian
Rev. Dr. K.R. Rajasekaran
Rev. Dr. William Robert, Ph.D., DD, D.Lit.

**EDITOR, PUBLISHER & PRINTER**

Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766
Cell : (+91) 98410 71852, 98412 71858 95661 31858

**E.MAIL**

sam@echoofhiscall.org
biblecor@yahoo.co.in

**WEBSITES**

www.echoofhiscall.org
www.stpaulsmatriculation.org

**YOUTUBE CHANNEL**

Echo of His Call

1 පිටුවෙන්....

## 1). ඔබගේ සිත ආරක්ෂා කරගන්න.

*''සියල්ලටම වඩා නුඹේ සිතේ ආරක්ෂා කර ගනින්න මක්නිසාද එයින් ජීවනය නික්මෙන්නේය.'' (හිතෝපදේශය 4:23)*

හෙබ්‍රෙව් භාෂාවෙන් ''සිත'' යන පදයට බැර් කියන වචනය පාවිච්චි කරයි. එහි තේරුම නම් අපගේ සියලුම හැඟීම් සහ සිතුවිලි වාඩි වී සිටින ආසනයයි. අප කල්පනා කරන්නේත් තීරණ ගන්නේත් සහ කරුණු සොයන්නේත් එම ආසනයේ සිටය. දේව වචනය තුළ අපගේ හදවත ආරක්ෂා කර ගන්න කියා පවසන්නේ එම නිසාය. මන්ද අපගේ මුළු ජීවිතයම පාලනය කරමින් අප යා යුතු මාර්ගය පෙන්නුම් කරනු ලබන්නේ අපගේ හදවත තුළිනි.

අප කවුද යන්න අපගේ හදවත තීරණය කරයි. සමහරවිට අපට එය තේරුම් ගැනීමට නොහැකිය. ''මා විමසා බලා මගේ හදවත දැනගත මැනව'' කියා දාවිත් යාඥා කරනු ලැබුයේ එබැවින්ය. එමනිසා අපගේ හදවත කැලඹිලිකාරව, රැවටිලි කාරව තිබේ. එම හදවත තුළ තිබෙන දේ අපගේ මැවුම්කාර ස්වාමීන් වහන්සේට පමණක් සොයා බැලීමට හැකියි. ඒ නිසා අපගේ හදවත තුළ තිබෙන සියලු නපුර පවිත්‍ර කිරීමට හැකි වන්නේ ස්වාමීන්වහන්සේට පමණි.

දෙවියන්වහන්සේ අපගේ හදවත තුළ තිබෙන පාපිෂ්ට සිතුවිලි පමණක් නොව උන්වහන්සේ අපගේ සියලු වේදනාවන් සහ අප උසුලාගෙන යන සෑම බර ගැනත් උන්වහන්සේ දනී. ගීතාවලිය 26:2 හි පවසන ආකාරයට; *''ස්වාමීනි මා සෝදිසි කොට පරීක්ෂා කළ මැනව මාගේ හෘදයත් සිතත් විමසා බැලුව මැනව.''* අපගේ ක්‍රියාවන් අපගේ සිතුවිලි නිතරම ඒකාකාරව තිබෙන්නේ නැත. අපි හරි කියා සිතමින් අප කරන දෙය උන්වහන්සේගේ ඇස් ඉදිරියෙහි එය වෙනත් ආකාරව පෙනෙයි. මන්ද අපගේ ආත්මය විමසා බලන්නේ දෙවියන් වහන්සේය.

ශුද්ධ වූ ලියවිල්ල අපට මෙසේ මතක්කර දෙයි. *''ස්වාමීන්වහන්සේ වන මම එකිනෙකාට තම තමාගේ මාර්ග ලෙසද ක්‍රියාවල පළ ලෙසද දෙන පිණිස සිත විභාග කොට අදහස් සෝදිසි කරමි.'' (යෙරමියා 17:10)* හි පවසන්නේ මේ නිසාය. අපගේ හදවත ඉතාම ප්‍රවේශමෙන් ආරක්ෂා කරගත යුතුයි. අපට අපගේ හදවත ආරක්ෂා කරගන්නේය කියා දේව වචනය ඉතා තදින්ම පවසයි.

නැවත දේව වචනය මතක් කරන්නේ; *''සියල්ලටම වඩා නුඹේ සිත ආරක්ෂා කර කරගනින්න; මක්නිසාද එයින් ජීවනය නික්මෙන්නේය.'' (හිතෝපදේශ 4:23)* එසේම, හිතෝපදේශ 23:7 හි මෙසේ උගන්වයි *''මක්නිසාද තමාගේ සිතෙහි ගණන්ගන්නා ලෙසම ඔහුට වන්නේය......''*

ප්‍රිය දෙවියන් වහන්සේගේ දරුවෙනි, ඔබගේ හදවතට ඇතුළුවන දේ ගැන ඔබ ඉතාමත් සැලකිලිමත් වෙන්න. මාධ්‍ය ජාලය, ඔබ කියවන පොත්පත්, ඔබ නරඹන චිත්‍රපට, ඔබ ආශ්‍රය කරන මිතුරන් හා ඔබ කතා කරන කතාවන් යන මේ සෑම දේම ඔබගේ හදවතට බලපෑම් ඇති කරනු ලබයි. එබැවින් ඔබ ඔබගේ හදවත ආරක්ෂා කරගත යුතුයි.

## 2). ඔබගේ මුඛය ආරක්ෂා කරගන්න.

අප මුඛය කියා පවසන විට එයට අපගේ දිවත් අඩංගුය. එය ඉතා බලවත්ය.

*''එලෙසම දිව කුඩා අවයවයක් නමුත් ලොකුවට පාරට්ටු කරකර ගනීව කුඩා ගින්නකින් කොපමණ මහත් වනාන්තරයක් පත්තු වෙනවා නොවේද! දිවද ගින්නක්ය. අපේ අවයවයන් අතරේ අධර්මිෂ්ටකමේ ලෝකයක්ය. ඒක මුළු ශරීරය කිලුටු කොට, සකල ලෝකයට ගිනි අවුලවයි. ඒකට ගිනි ඇවිලෙන්නේ නිරයෙන්ය.'' (යාකොබ් 3:5-6)*

අපගේ මුඛයෙන් පිටවන වචන කරනකොට ගෙන කෙනෙකුගේ ජීවිතය ගොඩනැගීමට හෝ එය කඩා දැමීමට හැකිය. ඒ නිසා අපගේ දිවෙහි වචනවල තිබෙන බලය ගැන අප දැනගත යුතුයි. බොහෝ අවස්ථාවන් වලදී අප කෝපයෙන් වචන පිටකරයි. පසුව අප; 'මම එය පැවසුවේ කිසිම තේරුමක් ඇතිව නොවෙයි' කියා ප්‍රකාශ කරයි. අප බොහෝ ප්‍රේම කරන අයව අප අයුතු ලෙස ප්‍රයෝජනයට ගෙන අපගේ කෝපය, අපගේ කෝන්තිය, අපගේ කලකිරීම සහ අපගේ දුක තුළින් අප ඉතා තදිසියෙන් වචන හුවමාරු කරයි.'

මෙලෙස අපි කී වරක් අපගේ කෝපය තවත් අයට පෙන්වා තිබේද? ඔවුන්ට අපට විරුද්ධව ක්‍රියා කිරීමට බලයක් නොමැති බව අප දැනගෙන අපගේ කෝපය ඔවුන් පිටට ප්‍රකාශ කර ඔවුන්ව දුකට පත් කරයි.

බයිබලය අපට මෙසේ අවවාද දෙයි.

*''තමාගේ මුඛයත් දිවත් රැකවල් කර ගන්නා තමාගේ ප්‍රාණය විපත්ති වලින් රැක ගන්නේය.'' (හිතෝපදේශ 21:23)* ගීතාවලියෙහි ඉතා ලස්සන යාච්ඤාවක් තිබෙයි. *''ස්වාමීනි මාගේ කටෙහි රැකවලක් තබා, මාගේ තොල් නමැති දොර රක්ෂා කළ මැනව.'' (ගීතාවලිය 141:3)*

අපගේ මුඛයෙන් පිටවන සෑම වචනයක් ගැනම ප්‍රවේසම් වෙමින් මෙවැනි යාච්ඤාවක් කළ යුතුයි.

## (3). ඔබගේ පාදය ආරක්ෂා කරගන්න.

*''......නුඹේ පාද බලා බලාගනින්න......'' (දේශනාකාරයා 5:1)*

අප ගන්නාවූ සෑම පියවරක්ම අපගේ අනාගතය තීන්දු කරයි. එම නිසා අප ඉතා ප්‍රවේසමෙන් ඇවිදිය යුතුයි. අපගේ පාදය අප තබන්නේ කොහැනද? අප ගමන් කරනු ලබන්නේ කුමන දිශාවටද? යන්න ගැන අප ඉතා අවධානයේ සිටිය යුතුයි.

එසේම අප කොහාටද ගමන් කරන්නේ, කුමන අරමුණකින්ද එතනට යන්නේ කියා අවධානයෙන් සිටිය යුතුයි. බොහෝ අවස්ථාවන්වලදී අපගේම බලය තුළ අප විශ්වාසය තබා අප වැරදි පියවරයන් තබමු. එම පියවර අප විනාශයට ගෙන යයි. ගෙනයයි. එපමණක්ද නොව අපව දෙවියන් වහන්සේගෙන් ඉතා ඈතට ගෙන යාමටද පුළුවනි. අප ගන්නාවූ සෑම පියවරකදීම දෙවියන්වහන්සේ

අපට කිරීමට යන්නාවූ ආශිර්වාද වලට බාධාවක් වීමටද පුළුවනි.

එමනිසා අපගේ සියළුම සැලසුම් උන්වහන්සේගේ කැමැත්තට යටත් කර උන්වහන්සේට භාරදිය යුතුයි. හිතෝපදේශ 16:9 හේ මෙසේ පවසයි; *"මනුෂ්‍යයාගේ සිත ඔහුගේ මාර්ගය යොමු කරවයි; එහෙත් ඔහුගේ පාද හසුරුවන්නේ ස්වාමීන්වහන්සේය."* අපගේ දෙවියන් වහන්සේ අල්ෆා සහ ඔමේගා දෙවියන් වහන්සේය. ස්වාමීන් වහන්සේ අපගේ අතීතය, වර්තමානය සහ අනාගතය දනී. අපගේ සාර්ථක බව හා අසාර්ථක භාවයද දනී. අප සෑමදේම උන්වහන්සේගේ දෑතට භාර දෙන විටදී අපට ස්ථිරව සිටීමට පුළුවනි. උන්වහන්සේ සෑම දේම අපගේ යහපතට පෙරළන අතර උන්වහන්සේ අපට බොහෝසෙයින්ප්‍රේම කරයි. එනිසා උන්වහන්සේගේ ජීවිතය අප උදෙසා පූද කරමින් මළවුන්ගෙන් නැගිට්ටේය.

දැන් උන්වහන්සේ අපට පවසන්නේ; උන්වහන්සේගේ සර්වබලධාරීත්වය තුළ විශ්වාසය තබන්න කියාය. *"ඔබගේ වාක්‍ය මාර්ගයෙහි මාගේ පාද හැසිරෙව්ව මැනව; කිසි අයුක්තකට මා කෙරෙහි බල පවත්වන්නට ඉඩ නොදුන මැනව."* (ගීතාවලිය 119:133) මෙය අපගේ යාච්ඤාව විය යුතුයි. තවද මගේ සියලු තරුණ මිතුරන්ට මෙසේ පැවසීමට කැමැත්තෙමි; ඔබගේ යෞවන කාලයේ ඔබගේ මාර්ග ස්වාමීන්වහන්සේට භාරදෙන්න. ඔබ ඔබගේ සැබෑ සාර්ථකත්වය භුක්ති විඳියි.

## 4). තණ්හාවෙන් ඔබවම ආරක්ෂා කරගන්න.

අපගේ අභිලාෂය සහ තණ්හාව යන දෙක අතර ඇත්තේ කුඩා වෙනසකි. අභිලාෂය යන්නෙහි තේරුම ඉතා සුබදායක දෙයකි. නමුත් තණ්හාව කියන දෙය විනාශකාරී දෙයකි. යේසුස්වහන්සේ අපට අවවාද කරන්නේ

*"සියලු ආකාර ලෝභකමෙන් ප්‍රවේසම් වෙන්ට බලා ගනිල්ලා."* (ලූක් 12:15)

'තන්හාව' යන වචනයට ඉංග්‍රීසි මක්සිෆර්ඩ් ශබ්දකෝෂයේ සඳහන්ව ඇති තේරුම නම්, අප සතුව තිබෙන මුදල් ප්‍රමාණය හෝ අපට තිබෙන බලතලයට වඩා වැඩි යමක් ලබා ගැනීමට ආශාවීමකි. එනම්; අපට කන්න පුළුවන් ප්‍රමාණයට වඩා බීමට හැකි ප්‍රමාණයට වඩා ලබා ගැනීමට ඇති ආශාවීමයි. අපට අවශ්‍ය කරන දේට වඩා වැඩි තණ්හාවක් ඒ සඳහා තබා ගන්නේ නම්, එය අපගේ අභිලාෂයට බාධාවකි.

දෙවියන්වහන්සේගේ වචනය අපට උගන්වන්නේ අපගේ ජීවිතය මෙවැනි තණ්හාවලින් ආරක්ෂා කරගත යුතුයි කියාය.

*"නුඹලාට ඇති දෙයින් සතුටු වී වස්තු තෘෂ්ණාවෙන් තොරව සිටපල්ලා. මක්නිසාද මම කිසිසේත් නුඹෙන් අහක්ව නොයමි, කිසි අත්දමකිනවත් නුඹ අත් නොහරිමි උන්වහන්සේම කියා තිබේ." (හෙබ්‍රෙව් 13:5)*

අප ආශාවෙන්නා වූ සෑම දේම අප ඉදිරියේ තිබෙන්නට අවශ්‍යය යන්න නොව, අප ආශා කරන සෑම දේම දෙවියන්වහන්සේ කෙරෙන්ම පැමිණිය යුතුයි. මන්ද මේ ලෝකයත් එහි ඇති සියල්ලත් උන්වහන්සේගේ හස්තයේ තිබේ. එය පාලනය කරන්නේ, ස්වාමීන්වහන්සේය. අපගේ ජීවිතයේ සෑම අවස්ථාවකදීම උන්වහන්සේ ක්‍රියා කරන්නේ අපගේ යහපත උදෙසාය. උන්වහන්සේ අපව අමතක කරන්නේවත් අත්හරින්නේවත් නැත කියා උන්වහන්සේ පවසා ඇත. අපගේ ජීවිත ගමනේදී උන්වහන්සේ අපව මාර්ගයේ අත් නොහරියි.

උන්වහන්සේ විශ්වාසවන්තවත් අප යා යුතු ස්ථානයට අපව අවසානය දක්වා ගෙන යන සේක. රෝම 8:32 හි මෙසේ පවසා ඇත; *"තමන්වහන්සේගේම පුත්‍රයා ඉතුරු කර නොගෙන අප සියල්ලන් උදෙසා පාවා දුන්නා වූ තැනැත්වහන්සේ පුත්‍රයා ඇතුළුව අනෙකුත් සියල්ල අපට නොදෙන්නේ කෙසේද?"*

ප්‍රිය සහෝදරයා සහෝදරිය, ශක්තිමත් වෙන්න. උන්වහන්සේ යෙහෝවා ජයිරෙයි. අපට සපයන දෙවියන් වහන්සෙයි. උන්වහන්සේගේ තේජසේ සම්පත් ප්‍රකාරයට අපගේ සියලු අවශ්‍යතාවයන් ඔබට සැපයීමට හැකිය. උන්වහන්සේව තදින් අල්ලා ගන්න. උන්වහන්සේව විශ්වාස කරන්න. එවිට උන්වහන්සේ ඔබට ස්වර්ගීය ආශිර්වාද වලින් ආශිර්වාද කරන සේක.

අපගේ ජීවිතයේ මුදල් වලට තිබෙන තණ්හාවෙන් අප විශේෂයෙන් ආරක්ෂා විය යුතුයි. *"මක්නිසාද වස්තු තෘෂ්ණාව සියලු ආකාර නපුරේ මුලක්ය ........" ( 1 තිමෝති 6:10)* එලෙසම දේව වචනය අපට මෙලෙස මතක් කර දෙයි. *"රිදියට ඇලුම් වෙන්නා රිදියෙන්වත් සම්පත්වලට ඇලුම් වෙන්නා ලාභයෙන්වත් තෘප්තියට නොපැමිණෙයි ........." (දේශනාකාරයා 5:10)* මුදල් වලට ආශාවන හදවත කිසිම සෑහීමකට පත්වන්නේ නැත.

....Contd. to page 6





**ඉතා හදිසි දැනුම් දීමක්!**

ඉදිරියේදී කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව තැපැල් මගින් යැවීමේදී නොවැළැක්විය හැකි බාධාවන් ඇතිවීමට හැකිය. එබැවින් ඔබට කිසිඳු බාධාවකින් තොරව කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව දිගටම ලබා ගැනීමට අවශ්‍ය නම්, කරුණාකර ඔබගේ නම, ලිපිනය, විද්‍යුත් තැපැල් සහ whatsapp අංකය සඳහන් කර ලිපියකින්, විද්‍යුත් තැපෑලෙන්, දුරකථන ඇමතුමකින් හෝ sms / Whatsapp පණිවිඩයක් හරහා ඉක්මනින්ම අප වෙතට ලැබෙන්නට සලස්වන්න.

ඔබගේ සහයෝගය අපට ඔබට හොඳින් සේවය සලසා දීමට උපකාරී වෙයි!

අපගේ ලිපිනය:

**ECHO OF HIS CALL,**
10, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005, India
Cell: (+91) 98412 71858 / 98410 71858 E.mail: sam@echoofhiscall.org

GREAT COMMISSION PARTNERS
ECHO OF HIS CALL MINISTRIES
SINCE 1969

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

බෙදා ගැනීම (ගලාති 6:2)
උපකාර කිරීම (රෝම 12:13) සහ
පුබුදු කිරීම (2 තිමෝති 1:6)

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**ඔක්:19 -** අලෝකයේ පුරා බයිබල් සහ කිතුණු සාහිත්‍ය පොත්පත් මුද්‍රණය කිරීමේ නිරතව සිටින අයගේ සියලු අවශ්‍යතා සපුරා දී තිබෙන නිසා ස්තුති කරන්න.

**ඔක්:20-** අපගේ සහකාර කර්තෘවරුන් සහ ඔවුන්ගේ සහයකයින්ගේ ආරක්ෂාව නිසා ස්තුති කරන්න.

**ඔක්:21 -** විවිධ සේවාවන් හරහා සුභාරංචිය ප්‍රකාශ කිරීමට අපගේ ජ්‍යෙෂ්ඨ දේවගැති තුමාගේ කැපවීම නිසා ස්තුති කරන්න.

**ඔක්:22-** අපට අනෙකුත් සියලු සේවාවන්ට සහාය වීමට හැකිවී තිබෙන නිසා ස්තුති කරන්න.

**ඔක්:23 -** අපගේ සහකාර කතෘවරුන්ට සහ ඔවුන්ගේ පවුල්වලට ආශිර්වාද කර තිබෙන නිසා ස්තුති කරන්න.

**ඔක්:24-** ශාන්ත පාවුළු මෙට්‍රිකියුලේෂන් පාසලේ ඉරුදින ළමා වැඩසටහන්වලට නවක සිසුන් ඇතුළත් වී තිබෙන නිසා ස්තුති කරන්න.

**ඔක්:25-** අපගේ තැපැල් මාර්ගික බයිබල් පාඩම් මාලාව සහ දේව ධර්මය තැපැල් මාර්ගික පාඩම් මාලාව වර්ධනය වී තිබෙන නිසා ස්තුති කරන්න.

**ඔක්:26-** අපගේ ආධාරකරුවන් සහ ඔවුන් දේව සේවයට දක්වන්නා වූ සහභාගිත්වය නිසා ස්තුති කරන්න.

**ඔක්:27-** අපගේ යාච්ඤා හවුල්කරුවන් දායක හවුල්කරුවන් ඇදහිල්ලේ හවුල්කරුවන් ජීවිත කාලය පුරා හවුල්කරුවන් මහා ආඥාවේ හවුල්කරුවන් සහ ඔවුන්ගේ පවුල්වලට දෙවියන් වහන්සේගේ කරුණාව ලැබී තිබෙන නිසා ස්තුති කරන්න

**ඔක්:28-** ශ්‍රී ලංකා දේශයේ බොහෝ ස්ථානවල සුභාරංචිය ප්‍රකාශ කිරීමට කිතුණු සභාවට දොරවල් විවෘත වී තිබෙන නිසා ස්තුති කරන්න

**ඔක්:29-** අපගේ ප්‍රධාන සභාවේ තරුණ සේවය වර්ධනය වී තිබෙන නිසා ස්තුති කරන්න.

**ඔක්:30-** අපගේ ධර්මදූත සේවයේ යෙදීසිටින්නාවූ අය සහ ඔවුන්ගේ පවුල්වලට ආශිර්වාද කර තිබෙන නිසා ස්තුති කරන්න.

**ඔක්:31-** අපගේ ප්‍රධාන සභාවේ පුරුෂ සේවයට දෙවියන්වහන්සේගේ ආශිර්වාදය වගුරුවා තිබෙන නිසා ස්තුති කරන්න.

**නොවැ:31-** පසුගිය මාසයේදී අපගේ මූල්‍යමය අවශ්‍යතා සහ අධ්‍යාත්මික අවශ්‍යතා සපුරා තිබෙන නිසා අපගේ හදපිරිස ස්තුතිය පුද කරමි.

**නොවැ:02-** අපගේ සුභාරංචි පත්‍රිකා මුද්‍රණාලයේ අඛන්ඩ ක්‍රියාකාරීත්වය සහ එහි සේවකයින්ගේ කැපවීම නිසාස්තුති කරන්න.

**නොවැ:03-** අපගේ සියලු සේවාවන් වලට දෙවියන් වහන්සේගේ මග පෙන්වීම ලැබුණු නිසා ස්තුති කරන්න.

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**නොවැ:04:** අපගේ නෙහෙමියා බයිබල් විද්‍යාලේ නේවාසික සහ සන්ධ්‍යාකාලයේ සහභාගි වන ශිෂ්‍යයින්ගේ විභාග සහ කැපවීම නිසා යාච්ඤා කරන්න

**නොවැ:05-** සියලුරම ජාතීන් අතර ඒකත්වය සහ සමාදානය ඇතිවන පිණිස යාච්ඤා කරන්න.

**නොවැ:06-** අපගේ ප්‍රධාන සභාවේ සහ ශාඛා සභාවන්වල කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ ඇදහිලිවන්තයින් සහ ඔවුන්ගේ පවුල් වල සුභ සාධනය පිණිස යාච්ඤා කරන්න.

**නොවැ:07-** මත්ද්‍රව්‍ය උගුලෙන් සියලු දරුවන් සහ තරුණ තරුණියන් සියලුර දෙනාම ආරක්ෂා කර දෙන පිණිස යාච්ඤා කරන්න.

**නොවැ:08-** අපගේ සහකාර කර්තෘවරුන් සහ ඔවුන්ගේ පවුල් වලට යහපත් සෞඛ්‍යයක් සහ ආරක්ෂාවක් ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**නොවැ:09-** ලෝකය පුරා ව්‍යාප්තව පවතින ළමා ජාවාරම් මුළුමනින් ඉවත් වන පිණිස යාච්ඤා කරන්න.

**නොවැ:10-** සියලුම කිතුණු සේවාවන්වල බලවත් ප්‍රාතිහාර්යයන් පුදුම දේ සහ ලකුණු සිදුවන පිණිස යාච්ඤා කරන්න.

**නොවැ:11-** අපගේ හවුල්කරුවන් රාජ්‍ය සම්බන්ධීකාරකවරුන් සහ ඔවුන්ගේ පවුල් උදෙසා යාච්ඤා කරන්න.

**නොවැ:12-** ලෝකයේ බොහෝ ප්‍රදේශයන් මුහුණ දෙනු ලබන ආර්ථික අවපාතයන් වලට සහනයක් ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**නොවැ:13-** ලෝකය පුරාම දෙවියන්වහන්සේගේ රාජ්‍යයයේ සුභාරංචිය ප්‍රකාශ කරන පිණිස කිතුනු සභාවට නව දැක්මක් හා මග පෙන්වීමක් ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**නොවැ:14-** ආර්ථිකය කඩා වැටී තිබෙන නිසා පීඩාවට පත්ව සිටින සියලු මනුෂ්‍යයන්ගේ ආර්ථිකය නැවත නගා සිටුවන පිණිස යාච්ඤා කරන්න.

**නොවැ::15 -** ලොව පුරා විසිරී සිටින මිෂනාරිවරුන්ට දෙවියන්වහන්සේගේ දිව්‍යමය ආරක්ෂාව සහ උපකාරය ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**නොවැ:16--** සෑම ජාතියක්ම දේවභය ඇති නායකයින් විසින් මෙහෙයවනු ලබන පිණිස යාච්ඤා කරන්න.

**නොවැ:17--** අපගේ සියලු සේවාවන්ට අවශ්‍ය වැටුප්, මුද්‍රණ සැපයුම් තැපැල් ගාස්තු සහ ප්‍රවාහනය ඇතුළු අපගේ සියලු මූල්‍යමය අවශ්‍යතා සපයා දෙන පිණිස යාච්ඤා කරන්න.

**නොවැ:18--** සියලුම ඇදහිලිවන්තයින්ගේ හදවත් දෙවියන් වහන්සේගේ ආලෝකයෙන් ආලෝකමත් වන පිණිස යාච්ඤා කරන්න.

....Contd. from page 4

කරුණාකර මෙය තේරුම් ගන්න. ප්‍රශ්නය මුදල් පමණක් නොවන්නේය. මන්ද අපට මේ ලෝකයේ ජීවත් වීමට මුදල් අවශ්‍යයි. අප මුදල් උපයා අපගේ පවුල රැකබලා ගත යුතුයි. නමුත් ආත්මික දේ අතපසුකර දෙවියන් වහන්සේගේ රාජ්‍යයේ දේවලට තිබෙන කැපවීම අඩුකර මුදල්වලට ආශාවෙන් මුදල් සෙවීමට කැපවෙනවා නම් එය භයානක තත්ත්වයකි. කොයි ආකාරයකින් වත් දෙවියන්වහන්සේ සමග යන්නා වූ ගමනට බාධා වන ආත්මික ජීවිතයට බාධා වන ලෙස මුදල් සොයා යන්න එපා. ඔබ දෙවියන් වහන්සේට ප්‍රේම කරමින් යාච්ඤා කරමින් ඔබට තිබෙන දෙයින් සෑහීමට පත් වී තණ්හාව ඉවත් කරගන්න.

## 5). ඔබට භාර දී ඇති දේ ආරක්ෂා කරගන්න.

*"තිමෝතියෙනි, .......... නුඹට භාර දුන් දෙය ආරක්ෂා කරපන්න." (1 තිමෝති 6:20)*

දෙවියන්වහන්සේ ඔබව විශ්වාස කර ඔබට භාරදී ඇති දේවල් ගැන මොහොතක් සිතන්න. ඒ දෙයට පිටස්තරව ඇතිවෙන්නා වූ සියලුම බලපෑම්වලින් එය නැතිකර නොගන්න. එය ඔබගේ පවුල වෙන්නට පුළුවනි, එසේත් නොමැති නම් ඔබගේ රැකියාව, ඔබගේ මුදල්, කැඳවීම, ආලේපය හෝ ඔබගේ සේවය වෙන්නට පුළුවන. දෙවියන් වහන්සේ ඔබට ඔබගේ ජීවිතයේ භාරදී තිබෙන දේවල් ආරක්ෂා කරගන්න.

එක් තලෙන්තයක් ලැබූ පුද්ගලයා එය වළා සඟවා තැබූවාක් මෙන් නොසිටින්න. දෙවියන් වහන්සේගේ කැමැත්ත නම්; අපගේ දැනට උන්වහන්සේ භාරදුන් දේ තවත් වැඩි කරමින් විශ්වාසවන්තව ඔබට තිබෙන වස්තුව වැඩි කිරීමය. එසේම ඔබව විශ්වාස කර දෙවියන් වහන්සේ ඔබට භාර දුන් දේ තවත් විශ්වාසවන්ත අයට ඔබ භාර දිය යුතුය. *"බොහෝ සාක්ෂිකාරයන් ඉදිරියෙහි නුඹ මාගෙන් ඇසූ දේම වෙන අයටත් උගන්වන්ට සමර්ථ වූ විශ්වාස වූ මනුෂ්‍යයන්ට භාර දීපන්න." (1 තිමෝති 2:2)*

ප්‍රිය මිතුවරුනි, දෙවියන්වහන්සේ අපට කළ දේ අන් අයට උගන්වන පිණිස අපව කැඳවා තිබේ. එනම්, මේවා අපගේ දරුවන්ට, ඊළඟ පරම්පරාවට, අප වටා සිටින සෑම දෙනාටත් අපිට දුන් උරුමය අප භාරදී යා යුතුයි. එලෙසම අප දෙවියන්වහන්සේගේ නාමය ගෞරවයට පත් කරමු

## 6). ඔබගේ ඇවිදීම සම්පූර්ණ සම්පූර්ණකර ඔබගේ විපාකය ලබා ගන්නා පිණිස ඔබව ආරක්ෂා කරගන්න.

බොහෝ දෙනෙක් තමාගේ ආරම්භය ඉතා හොඳින් පටන් ගන්න නමුත් ඔවුන් යන ගමනේ දී ඔවුන්ගේ අවධානය නැති කර ගනිමින් ඔවුන්ගේ ගමන් මාර්ගයෙන් ඉවතට ගොස් සිටී. නමුත් අපි යන ගමනේදී අප ඉතා බලසම්පන්නව එය නිමා කළ යුතුයි. අපගේ සේවය, දේව වචනය, යාච්ඤාව, යහපත් ක්‍රියා කිරීම ආදී කාරණාවන් කෙරෙහි තිබෙන අවධානයෙන් අද අප ඉවතට ගොස් සිටී. නමුත් අපි යන ගමනේදී අප ඉතා බලසම්පන්නව එය නිමා කළ යුතුයි.

මෑතකදී එක් තරුණයෙක් මට හමුවූ අතර ඔහු මට මෙසේ පැවසුවේය; "මා ක්‍රිස්තුස්වහන්සේ සමග ඇවිදීමට ඉතා ආශාවෙන් සිටියත් දෙවියන්වහන්සේ සමග කාල වේලාව ගත කිරීමටත් දේව වචනය කියවීමටත් නමස්කාර කිරීමටත් ආදී දෙයට කාලය දීමට නොහැකිව මා විශාල පොර බැදීමකින් සිටිනවා, තවත් සමහර දිනවලදී මට බයිබලය විවෘත කිරීමට ද සිතෙන්නේ නැහැ." කියා පැවසූ අතර මෙම පොරබැදීමෙන් ජයගන්නේ කෙසේදැකියා ඔහුට මාගෙන් මාගෙන් ප්‍රශ්න කළේය.

සමහර විට ඔබත් මෙවැනි තත්ත්වයක් තුළින් ගමන් කරනවා විය හැකිය. එම තරුණයාට මා මෙලෙස පිළිතුරු දුනිමි. "මෙලෙස ගමන් කිරීම ඔබට මහත් මලපතකි. එබැවින් ඔබ එලෙසම සිටිය යුතු නැත. මා දැන් ඉදිරියටම යනවාය කියා ඔබ ඔබගේ ඇතුලාන්තයෙන්ම තීරණයක් ගත යුතුයි. ඔබගේ හැඟීම්වලට ඉඩ නොදී ඉදිරියටම යන්න. මෙය ඔබ කළ යුතුම නිසා දැන් ඔබගේ හැඟීම්වලට ඉඩ නොදී ඔබ අනිවාර්යෙන්ම කළ යුතුය." කියාය.

අප ඉතා විනයානුකූලව අපගේ ඉලක්කය කෙරෙහි ගමන් කළ යුතුයි. දේව අපට පවසන්නේ; අප ආරම්භ කළ දෙය අප නිමා කළ යුතුයි කියාය. අපගේ විපාකය අපිට ලබා ගැනීමට හැකි වන්නේ එවිටය. *"අප විසින් කළ දේ නුඹලාට නැති නොවන ලෙසත් සම්පූර්ණ වූ විපාකයක් නුඹලාට ලැබෙන ලෙසත් නුඹලාම බලා ගනිල්ලා." (1 යොහාන් 8)*

අපගේ ස්වාමීන් වහන්සේ අපගේ දිවිම විශ්වාසවන්තව දිවීමට අපව ශක්තිමත් කරන සේක. උන්වහන්සේ අප තුල ආරම්භ කළාවූ ක්‍රියාව නිමා කරන සේක. අපව කැඳවූ දෙවියන්වහන්සේ අපට තබා තිබෙන විපාකය උන්වහන්සේ පැමිණෙන විට ලබාදෙන සේක.

## 7). දෙවියන් වහන්සේගේ වචනයට විරුද්ධව

**ක්‍රියා කරන්නන්ගෙන් ඔබව ආරක්ෂා කරගන්න.**

දෙවියන්වහන්සේගේ රාජ්‍යයට විරුද්ධව ක්‍රියා කරන්නන්ගෙන් අපව ආරක්ෂා කරගන්නය කියා දේව වචනය අපට ඉතා පැහැදිලිව පවසයි. *"ඔහු අතිශයින්ම අපගේ වචනවලට විරුද්ධව සිටිය නිසා නුඹත් ඔහුගෙන් ප්‍රවේසම් වෙයන්න." (2 තිමෝති 4:15)*

දේව වචනය අපට නිතරම උගන්වන්නේ; අප සියල්ලන්ටම ප්‍රේම කළ යුතු බවත් සියල්ලන් කෙරෙහි ඉවසීමෙන් සිටිය යුතු බවත්ය. *"පුළුවන් නම්, නුඹලාගෙන් විය හැකි ප්‍රමාණයට සියලු මනුෂ්‍යයන් සමග සමාදානයෙන් සිටපල්ලා." (රෝම 12:18)* ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරයේ එකමුතු භාවයට හානි කරන අය අපගේ සභාව තුළත් සමාජය තුළත් සිටින බැවින් අප ඔවුන්ව ඉවසීමෙන් දරා ගැනීමට හැකි විය යුතුය. නමුත් පාවුලු තුමා ඉතාම තදින්

....Contd. to page 9


# විශේෂ අවස්ථාවන්

## ජයග්‍රාහී සම්මාන

මෙම ජයග්‍රාහී සම්මාන පිරිනැමුමේදී; අපගේ සේවකයින් වන සහෝදරී නාග ජෝති, ගෞරවනීය ඇග්නස් සහ සහෝදරී මේරි මැක්ඩලින් යන අයටය 2025 අප්‍රියෙල් මස 27 වන දින ඔවුන්ගේ විශ්වාසවන්තකම, අවංක සේවය, ඔවුන් දේව රාජ්‍යයට දැක්වූ මහත් උනන්දුව අගය කරන පිණිස *කැඳවීමේ ප්‍රතිරාවය* සේවයෙන් ඔවුන්ට මෙම ජයග්‍රාහී සම්මාන පිරිනමනු ලැබුවේය.

## ගෞරවනීය ආචාර්ය උපාධිය

2025 අගෝස්තු මස 10 වන දින මෙම ගෞරවනීය ආචාර්ය උපාධිය පිරිනමනු ලැබුයේ; සහෝදර N. බාලාජි, මෝතිස් විනෝද් සහ සහෝදරී ඒන්ජලින් සෙල්වි කුමාරි යන අයටය. ඔවුන්ගේ ස්ථිර කැපවීම් හා සේවය නිසා *කැඳවීමේ ප්‍රතිරාවය* සේවය තුළින් මෙම උපාධි පිරිනැමුවේය.








Senior Advocate N. Balaji, Rev. M. Mothis Vinoth and Sis. Angeline Selvakumari Henry got Doctorate in Ministry

## කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ 57 වන සංවත්සරය.



Rev. Dr. Stephen Devakumar and Rev. Dr. J. D. Charles - Special Speakers

2025 අගෝස්තු මස 10 වන දින කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ 57 වන සංවත්සරය අපගේ ප්‍රධාන සභාවේදී පැවැත්වුණි. Rev.Dr. ස්ටීවන් දේව කුමාර් සහ Rev.Dr.J.D. චාල්ස් යන දෙදෙනා ආරාධිත අමුත්තන් ලෙස සහභාගී වී මෙම අනර්ඝ අවස්ථාවේදී අපගේ සේවය අගය කළේය.

## ළමුන්ව කැපකිරීම

සහෝදර මෝහාන් සහ සහෝදරී රේචල්ගේ දරුවා වන ජාබෙෂ් ජේවාන්, සහෝදර සයිමන් සහ සහෝදරී එස්තර්ගේ පුතා වන බෙනඩික්ට් යන දරුවාව ද අප කැප කළෙමු.



Jabez Jevaan, son of Bro. Mohan & Sis. Rachel



Benetic son of Bro. Simson & Sis. Esther.

## ඩිප්ලෝමා සහ B.Th. පාඨම් මාලාව.

මෙම ඩිප්ලෝමා සහ B.Th. පාඨම් මාලාවන් චේපාක් සහ සන්තෝෂ පුරම් වල තිබෙන නෙහෙමියා බයිබල් විද්‍යාලවලදී ආරම්භ කරනු ලැබුවෙමු. මෙම පාඨමාලාවට බොහෝ ශිෂ්‍ය ශිෂ්‍යයින් සහභාගි වීම ඉතා අනර්ඝයි.



Nehemiah Bible College students in Chepauk



Nehemiah Bible College students in Santhoshapuram

ECHO OF HIS CALL REACHING NATIONS SINCE 1969
1969 TO 2029

**NEHEMIAH BIBLE COLLEGES,**

Qualification : 10th Standard & above

Chepauk & Santhoshapuram, Velachery Chennai.

Rush for admission! Medium : Tamil (Part Time)
Hindi (Residential) (Sponsorship Available)

Diploma in Theology

Recognised by International Christian Leaders & Senior Pastors for the past 56 years

Contact : The Chairman, Nehemiah Bible College.
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA.
Phone : (+91-44) 2852 8282, Cell : (+91) 98410 71852 / 95661 31858
E.mail : sam@echoofhiscall.org / Website : www.echoofhiscall.org



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

### "...කියවන්නා තේරුම් ගනීවා...." *(මතෙව් 24:15)*

## දුර්වල තැනැත්තාගේ යාච්ඤාවට දෙවියන්වහන්සේ පිළිතුරු දෙයි!



වර්ෂ 1969.08.10 වන දින මා සුභාරංචි සේවයේ පත්‍රිකා බෙදා දෙමින් සහ යාච්ඤා රැස්වීම් තබමින් දේව වචනය බොහෝ සභාවන්වල දේශනා කරමින් දෙවියන් වහන්සේගේ කරුණාව කරන කොටගෙන උන්වහන්සේගේ සේවය ආරම්භ කළෙමි. කිසිවෙක් මාව දෙවියන්වහන්සේගේ දාසයෙක් ලෙස පිළිගත්තේ නැත. මා මෙම සේවයට අලුත් කෙනෙක් නිසාත් මා තරුණ කෙනෙක් නිසාත් මගේ ආර්ථික තත්ත්වය ඉතාම දුර්වල තිබුන නිසාත් මා බොහෝ ස්ථානවලට පයින් ගමන් කරමින් මගේ සේවය කළ නිසාත් මා ගැන එතරම් පිළිගැනීමක් තිබුණේද නැත. මෙම සේවය නිසා මට බොහෝ ආර්ථික අවශ්‍යතා පැන නැගුණි.

මගේ සේවය ආරම්භ කළ කාලයේ සිටම මගේ හදවතේ තිබුණු දේ නම්, මා කිසිවිටෙක කිසි මනුෂ්‍යයෙකුගෙන් කිසිදු උපකාරයක් ලබාගන්නේ නැත කියාය. දෙවියන් වහන්සේ මාව සේවයට තෝරාගත් නිසා ස්වාමීන්වහන්සේම මාව බලා ගන්න ඕනෑය කියන ස්ථිර තීරණයෙහි මා සිටියෙමි. මෙම තීරණයට අද වනතුරු ස්ථිරව සිටීමට දෙවියන් වහන්සේ මට උපකාර කර තිබේ.



මගේ මෙම ප්‍රතිපත්තිය නිසා මට බොහෝ ප්‍රශ්නවලට මුහුණ දීමට සිදුවී තිබුණි. එම්නිසා මා මානසිකවත් ශාරීරිකවත් බොහෝ අමාරුකම් තුළින් ගමන් කළෙමි. ඒ කාලයේදී මගේ ඥාතියෙක් වන ස්වර්ණ රාජ් මහතා මට රජයේ රැකියාවක් එනම්, ගමනාගමන මණ්ඩලයේ රැකියාවක් ලබා දීමට උත්සාහ දැරුවේය. තවත් කොලින් නැමැති දේවදාසයෙක් පුද්ගලික ආයතනයක මට රැකියාවක් ලබා ගැනීමට උපකාර කළේය. මේ දෙදෙනාගේම උත්සාහය නිෂ්ඵල වුණේය.

ස්වාමීන් වහන්සේගේ ආත්මයේ මග පෙන්වීම තුළින් 1971.06.17 වන දින මා හට ස්ථිර රැකියාවක් ලබා දෙන්නේ කියා යාච්ඤා කළෙමි. එම යාච්ඤාව කළ පසු; තව මාසයකින් මා හට ස්ථිර රැකියාවක් ලැබෙන්නේය යන මහත් වූ ස්ථිරත්වයක් මගේ හදවත තුළට පැමිණුනේය.දේව වචනය සඳහන් කර තිබෙන ආකාරයට; *"උන්වහන්සේ ඉදිරියෙහි අපට තිබෙන නිසැකකම නම්; අප උන්වහන්සේගේ කැමැත්ත ලෙස යමක් ඉල්ලුවොත් උන්වහන්සේ අපේ ඉල්ලීම අසන බවය අප යම් දෙයක් ඉල්ලන කල උන්වහන්සේ අසන බව අපි දනිමු නම්, අප උන්වහන්සේගෙන් ඉල්ලූ දේ අපට ලැබෙන බව දනිමුව." (යොහාන් 5:14-15)* මෙලෙස මට අලුත් රැකියාවක් ලැබුණු බව මා විශ්වාස කළෙමි. ඒ නිසා එම රැකියාවට යාම සඳහා මා සූදානම් වුවෙමි. එලෙස මා සූදානම් වන ආකාරය දුටු අය මට කිසියම් මානසික ප්‍රශ්නයක් ඇතැයි කියා විශ්වාස කළේය. නමුත් මා මුළුමනින්ම දෙවියන් වහන්සේව විශ්වාස කෙළෙමි.

මෙලෙස මාසයක් ගත වූ පසු සෑමදාම තැපැල් කාර්යාලයෙන් මට ලිපියක් තිබෙයිද කියා බලා සිටියෙමි. හරියටම 1971.06.18 වන දින මා ඇඳගිල්ලෙන් තැපැල් කාර්යාලය වෙතට





ගියෙමි. එහි සේවය කළාවූ නෙල්ලෙයි අප්පන් නමැත්තා මාව දුටු ක්ෂණිකවම ඔබට කිසි ලිපියක් නැහැ කියා පැවසුවේය. නමුත් දෙවියන්වහන්සේගේ පොරොන්දුව අල්ලාගෙන මා එහි තිබූ පුටුවක වාඩි වී යාච්ඤා කළෙමි. එම අවස්ථාවේදී සිදු වූ මහත් ආශ්චර්ය දේ නම් එම තැපැල් කාර්යාලයෙහි සිටි පුද්ගලයා මා හට කතාකොට; "ඔබට ලියාපදිංචි තැපෑලෙන් ලිපියක් තිබේ. අත්සන් කර බාරගන්නය" කියා පැවසුවේය.

මා එම ලිපිය විවෘත කර බලන විට තමිල්නාඩු රාජ්‍යයේ මහජන සේවා අංශයෙන් මට එම ලිපිය එවා තිබුණි. කම්කරු දෙපාර්තමේන්තුවට මාව පත්කර තිබේ කියා එහි සඳහන් කර





*Farewell by Mr. A. Shenbagam B.E., Chief Inspector of Factories with my co-workers at the time of leaving my Government job in 1994*



*My co-workers when I left my Government job - 1994*

තිබුණි. මීට වසර ගණනාවකට පෙර මා රජයේ විභාගයට පෙනී සිටි අතර එහි ප්‍රතිඵලයක් ලෙස මෙම රැකියාව මට ලැබී තිබුණි. මෙය යාච්ඤාවට පිළිතුරක් බව මා හොඳින් දනිමි. යාච්ඤාව නම් අපගේ ආත්මික ආයුධයයි.

පසුව මා ඉතා සතුටින් චෙන්නෙයි වලට පැමිණ එම රැකියාව බාරගත්තෙමි. මගේ සේවයෙන් ලැබුණු සියලු මුදල් මා දේව සේවය සඳහා පාවිච්චි කළෙමි. දෙවියන් වහන්සේගේ කරුණාව නිසා මගේ සේවා කටයුතු ද කරගෙන යාමට රජයෙන්ද මට අවසරය ලැබුණේය. 1994 වන වසරේ දෙවියන් වහන්සේ මාකල රැකියාව අතහැර පූර්ණ කාලීන සේවයට එන්නය කියා කැඳෙව්වේය. පසුව මා උන්වහන්සේගේ කැඳවීමට කීකරු වී පූර්ණ කාලීන සේවයට කැපවුවෙමි.

අපගේ දෙවියන්වහන්සේ යහපත්ය. උන්වහන්සේ සෑම දේම නිසි වෙලාවට ක්‍රියාත්මක කරන දෙවියන්වහන්සේය. උන්වහන්සේට ඇලුම් වෙන්න. සැබැවින්ම ඔබ සාර්ථක වනු ඇත. අද දවසේදීත් උන්වහන්සේ ඔබ ගැන බලා සිටියි.

*''ඔබ කෙරෙහි සිත තබා සිටින තැනැත්තා, ඔබ කෙරෙහි විශ්වාස කරන බැවින්, ඔබ ඔහු ශාන්ත සමාදානයෙන් ආරක්ෂා කරන සේක." (යෙසායා 26:3)*

************

....Contd. from page 6

මෙහි කතා කරන්නේ ඕනෑම කෙනෙක් දේව වචනයට විරුද්ධව ක්‍රියා කරනවා නම්, ඔවුන්ගෙන් අපව ආරක්ෂා කර ගන්නා ලෙසයි.

එසේම ඔහු පවසන්නා වූ දෙය නම්, අප ඉතාමත්ම අවධානයෙන් සිටින්න කියාත් වැරදි ඉගැන්වීම් ගැනත් අන්තිම කාලයේදී උගන්වන්නා වූ බොහෝ දේව වචනයට පටහැනි ඉගෙනීම් ගැනත් සත්‍යතාවයට විරුද්ධව ඇහුම්කම් නොදී තමාගේම කනට මිහිරි වචනයට පමණක් ඇහුම්කන් දෙන අයගෙන් ප්‍රවේසම් වෙන්නේ කියාය. අද සෑම ස්ථානයකම අපට දක්නට ලැබෙන්නේ අස්ථිර ලෙස වැනෙන අයවයි.

නමුත් පේතෘස් අපිට මෙසේ පවසයි. *''.....මනුෂ්‍යයන්ට වඩා දෙවියන් වහන්සේට අප විසින් කීකරු විය යුතුය." (ක්‍රියා 5:29)* අද මෙවැනි ප්‍රකාශනයන් නිර්භීතව ප්‍රකාශ කළ හැකි නායකයින් හා ඇදහිලිවන්තයින් කී දෙනෙක් සිටිනවාද? දේව වචනයට විරුද්ධව යන්නා වූ අයට විරුද්ධව නැගී සිටීමට අපට පුළුවන්ද? යමෙක් නිර්භීත ලෙස දේව වචනයට විරුද්ධව යන විට අප එයට එකඟ නොවෙමි කියා පැවසීමට අපට හැකිද?

මේ අධ්‍යයන කාලයේදී දේව වචනයට විරුද්ධව යන අයගෙන් ප්‍රවේසම් වෙන්නේ කියා දේව වචනය අපට අවවාද කරයි.

මිත්‍රවරුනි, අපගේ ජීවිතය තුළ අප ආරක්ෂා කරගත යුතු කරුණු හතක් මා ඔබට සඳහන් කළෙමි. මගේ යාච්ඤාව නම්, දෙවියන් වහන්සේ අපව ප්‍රඥාවෙන් හා නිර්භීතකමින් යුතුව ආරක්ෂා කරගන්නා පිණිසත්, දේව වචනය තුළ ස්ථිරව සිටින පිණිසත්, දෙවියන් වහන්සේගේ කරුණාව දෙන සේක, යේසුස්ක්‍රිස්තුස් වහන්සේ ඉතාම ඉක්මනින් පැමිණෙයි.

**ස්වාමීන් වහන්සේ ඔබට ආශිර්වාද කරන සේක!**

************

Posted at "Egmore RMS Patrika Channel" RNI NO. TN/SIH/2006/17846

## A good opportunity to get Echo of His Call monthly magazine at free of cost

If you could send the addresses of your friends / relatives through post, letter, e.mail, WhatsApp or phone to us, we will dispatch **Echo of His Call** monthly magazine to them at free of cost.

### ERROR

In our August 2025 Article first page, first para, we mentioned as 75th Independence Day celebration wrongly instead of 79th Independence Day. - Chief Editor

### NOTICE

Save our mobile numbers (+91) 98410 71858, (+91) 98412 71858 (main numbers) in your mobile phones.

- Editor

# ECHO OF HIS CALL

Monthly magazines in 16 languages, Bible Colleges, Postal Courses, Church Planting, Village English High School, Gospel Printing Press, Crusades, Seminars, Social Services, etc.

Annual Subscription : Rs. 100/- Life Subscription : Rs. 2000/-

The multifarious activities of **Echo of His Call Ministries** are supported by the free-will offerings and donations of God's children like you. You may support **Echo of His Call** and its activities as the Lord leads you. We need your help to send forth the Gospel to the unreached people and plant Churches.

If you would like to receive **ECHO OF HIS CALL** magazines regularly, please write to us with your e.mail Id and Cell Phone number. Whenever you change your postal or e.mail addresses, please do inform us your old and new addresses.

**Echo of His Call** is available in 16 languages in our website also. You can read them by going into the site as well as downloading them and get blessed.

Your letters, prayer requests and your financial helps (**Money Orders, Cheques or Demand Drafts, NEFT, PayPal (Sam Selva Raj, sam@echoofhiscall.org) PhonePe (98410 71858), Gpay (98410 71858), Western Union, MoneyGram, etc.**) to **ECHO OF HIS CALL** may please be sent to the address below.

Please send your **Land Phone / Mobile Phone Numbers and E.mail addresses** for updation.

Our address :
ECHO OF HIS CALL
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA
PH.: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98410 71852, 95661 31858 / E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in
Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.org

**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**
**Date of Publication: First week of every month**
**Date of Posting : 1st & 2nd of every month**
**Posted at "Egmore RMS Patrika Channel"**
**on 3rd OCTOBER 2025.**
If un-delivered please return to:
**ECHO OF HIS CALL (SINHALA)**
P.O. Box No. 2957,
Chepauk, Chennai - 600 005, INDIA.
Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766

***JESUS LOVES YOU!***

To

***GOD BLESS YOU!***

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by **S. Sam Selva Raj** at **Echo of His Call Printers,** New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**